**කරච්චි ප්‍රාදේශීය සභාව**
**කිලිනොච්චි දිස්ත්‍රික්කය**

----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 18 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු පොලී රු.10,132,127ක් අනෙකුත් ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකර සමුච්චිත අරමුදල් ලෙස දැක්වීම නිසා ආදායම්, මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි මෙලෙස සිදු නොවන අන්දමින් ගිණුම් ක්‍රමවේද අනුගමනය කරනු ලැබේ. | ස්ථාවර තැන්පතු පොලී ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුවේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.950,000කට මිලදී ගත් ට්‍රේලර් යන්ත්‍ර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීමෙන් වත්කම්වල වටිනාකම අඩුවෙන් ඉදිරිපත් කර තිබුණි. | මෙම වර්ෂයේ වත්කම් ලෙස දක්වනු ලැබේ. | වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ඝන අපද්‍රව්‍ය ගාස්තු හිඟ සහ ත්‍රිරෝද රථ වාහන නැවතුම් පොල ගාස්තු එකතුව රු.1,597,500ක් ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබීමෙන් ලැබිය යුතු ආදායම් ගිණුමේ ශේෂයත්, ආදායමත් සමාලෝචිත වර්ෂයේ අඩුවෙන් දක්වා තිබුණි. | මේ දක්වා ලැබිය යුතු ආදායම් ලෙස හෙළිදරව් කර නොතිබුණි. ඉදිරි කාලයේදී හිඟහිටි ලෙස දක්වනු ලැබේ. | හිඟ ආදායම් අවසන් ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

(ආ) **විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.2,274,789ක් තහවුරු කළ හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගෙවිය යුතු ණය ප්‍රමාණය තහවුරු කළ නොහැකි වී තිබුණි. | මෙම ණය ලබාගැනීම සම්බන්ධයෙන් කිසිදු ලේඛනයක් දැනට සභාව සතුව නොමැත. හිඟ මුදල් ගෙවන ලෙස අරමුදල විසින් මේ දක්වා ඉල්ලීම් කරද නොතිබුණි. | විගණනයට සාක්ෂි නියමිත කාලයේදී ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 128(ච) | 19,130 | වාහන ආදායම් බලපත්‍ර වාර්ෂිකව අළුත් කළ යුතු වුවත්, අළුත්කිරීමේ ප්‍රමාදය වෙනුවෙන් දඩ ගාස්තු ගෙවා තිබුණි. | දීර්ඝ කාලයක සිට අයිතිය මාරු නොකළ වාහන සඳහා අයිතිය මාරු කිරීම හේතුවෙන් අමතර ගාස්තු ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 790,311 | වර්ෂ 02 ක් ඉක්ම වූ කල් ඉකුත්වූ තැන්පතු 12 ක් සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | කාර්යයන් සම්පූර්ණ නොකළ අවස්ථාවේදී එම අඩුපාඩු ඇප මුදලින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 1989 වර්ෂයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (VIII) පරිච්ඡේදයේ 169-173 වගන්ති | 1,400,000 | කාර්යය පිළිබඳ විස්තරාත්මක මිණුම දක්වන ඇස්තමේන්තුගත මිනුම් සැලැස්ම සකස් නොකර එල්ලෙන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කර තිබුණි. | වර්තමානයේ සම්පූර්ණ කර නියමිත අයුරින් ගිවිසුම් අත්සන් කර ඇත. | ගැසට් පත්‍රයට අනුකූලව සිදු කළ යුතුවේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 1989 දිනැති 17 අප්‍රේල් VII පරිශිෂ්ඨයේ 16 හා 165 වගන්ති | - | රාජ්‍ය ආදායම්, වියදම්, අත්තිකාරම්, තැන්පතු, ණය, ස්ථාවර තැන්පතු සහ අදාල ගිණුම් සඳහා සභාව විසින් ප්‍රධාන ලෙජර් ගිණුම් සකස් කර නොතිබුණි. | ප්‍රධාන ලෙජර් ගිණුම් වර්තමානයේ සකස් කරමින් පවතී. | ගැසට් පත්‍රයට අනුකූලව සිදු කළ යුතුවේ. |
| (ඈ) | 2012 ජනවාරි 5 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3.2 වගන්තිය සහ පළාත් පාලන කොමසාරිස්ගේ අංක 02/2015(1) දරන චක්‍රලේඛය | 45,649,565 | සමාජ පදනමින් වූ ආයතනවලට කාර්යයන් භාරදීමේදි ප්‍රජා මූල සංවර්ධන නිලධාරි, සමීක්ෂණ නිලධාරි, සභා ලේකම්වරයාගේ අනමැතියකින් තොරව සභාවේ සභාපතිවරයා විසින් ප්‍රජාමූල මධ්‍යස්ථානවලට ප්‍රාග්ධන කාර්යයන් ලබාදී තිබුණි. | අනුමැතිය වෙනම ආකෘතියක ලබාගෙන නොතිබුණි. ගිවිසුමේ ලේකම්වරයා අත්සන් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | අංක 01/2012 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 3.4 වගන්තිය | 14,042,903 | බලප්‍රදේශය තුළ පවතින ප්‍රජාමූල මධ්‍යස්ථානවලට ප්‍රාග්ධන කාර්යයන් 20 ක සංඛ්‍යාවක් ලබාදී නොතිබුණි. | එක් වසමක ප්‍රජා මූල මධ්‍යස්ථානයක් බැගින් ක්‍රියාත්මක වන තත්ත්වයක් නොපැවැති නිසා වෙනත් වසම්වල ඇති ප්‍රජාමූල මධ්‍යස්ථාන තෝරා පත්කර ව්‍යාපෘති ලබාදී තිබුණි. | චක්රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය | 14,103,676 | ලැබිය යුතු කුලි සහ ගාස්තු අයකර ගැනීම සඳහා වූ ලිඛිත නියෝගය ලේකම්වරයා විසින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | 2020 මැයි 31 දින දක්වා රු.7,141,355ක් ලබාගෙන තිබුණි. ඉතිරිය අයකර ගැනීමට පියවර ගනිමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (උ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාවේ පළාත් මූල්‍ය රෙගුලාසි 2008 අංක 163(ii) | 1,107,088 | ගෙවනු ලැබූ අත්තිකාරම් අදාළ කාලය තුළ නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඌ) | 1983 අංක 24 දරන වැන්දඹු අනත්දරු උපහාර මූල්‍ය පනතේ 5 වගන්තිය | - | සභාවේ නිලධාරීන් 04දෙනෙකුට වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායක අංක ලබාගෙන නොතිබුණි. | නිලධාරීන් 03දෙනෙකුට වයස අවුරුදු 45කට වැඩිය. එක් නිලධාරියෙකු ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.50,583,351 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු.77,734,689 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,000,000 | 11,375,718 | - | 1,000,000 | - | - |
| (ii) | කුලී | 44,716,532 | 47,070,703 | 5,130,991 | 31,960,000 | 38,669,757 | 5,932,692 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 17,651,360 | 9,120,787 | - | 5,362,000 | 7,230,545 | - |
| (iv) | වෙනත් ආදායම් | 30,944,423 | 24,919,932 | 8,972,685 | 28,482,600 | 58,770,789 | 42,193,973 |
| | | 98,312,315 | 92,487,140 | 14,103,676 | 66,804,600 | 104,671,091 | 48,126,665 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාව ආදායම් ලැයිස්තු ගත කර එක්රැස් කිරීමට පසුගිය වර්ෂ 10 කට අධික කාලයක සිට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සභා බලප්‍ර දේශයේ හැකි තරම් ව්‍යාපාරික කටයුතුවල නිරතවන ආයතනවල විස්තර ලැයිස්තුගත කරමින් පවතින අතර සියයට 100ක් අයවැය සැලැස්මෙන් අයකිරීම් ඇතුළත් කර නොතිබුණි. අයකිරීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් ලැයිස්තුගත කර රැස් කළ යුතුය. |
| (ආ) | මෝටර් ග්‍රේඩරය සහ රෝලරය භාවිතා කර ක්‍රියාත්මක කළ කාර්යයන්වල හිඟ ආදායම් රු.1,468,672 ක් පසුගිය වර්ෂ 2 ක සිට අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කෙරෙමින් පවතී. | හිඟ ආදායම් අයකිරීමට නියමිත කාලය තුළ කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හරක් මස් කඩය නැවත මිල කැඳවීම් සිදු නොකර, ප්‍රසිද්ධ වෙන්දේසියක් සිදුකිරීම නිසා රු.2,855,000 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. | ආදායම් ප්‍රකාශයේ අත්සන් කර නොතිබුණි. ලංසුකරුගෙන් පැමිණිලි ලැබී නොතිබුණි. | මූල්‍යමය පාඩුවක් සිදු නොවන අයුරින් කටයුතු කළ යුතුය. |

### 2.2.3 කුලී හා බදු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුලී හා බදුවලින් රු.3,812,.717 ක හිඟ කුලී වර්ෂයකට අධික කාලයක සිට අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | නඩු පැවරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2.4 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.2,003,770 ක උසාවි දඩ මුදල් සහ රු.3,697,633 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | මුද්දර ගාස්තු රු.1,828,472 ක් සහ උසාවි දඩ මුදලින් රු.3,697,633 ක් ලැබී තිබුණි. | නියමිත කාලය තුළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන කාරණා 33ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් ස්ථාපිත කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා126 වගන්තිය ප්‍රකාරව, ප්‍රධාන කාරණා 33ම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ දරන 2016 පෙබරවාරි 22 දිනැති අංක 1952/16 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කරමින් පවතී. | පනතේ ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කළ යුතුවේ. |

(ආ) අතහැර දැමූ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු කළ රු.4,185,135ක ව්‍යාපෘති 09ක අපේක්ෂිත ප්‍රතිඵල අත්කරනොගෙන ක්‍රියාකරකම් මුළුමනින්ම අත්හැර දමා තිබුණි. | අදාල ව්‍යාපෘති සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු කිසිදු පෙර සුදානම් ක්‍රියාමාර්ගයන් කිසිවක් සිදු නොකිරීම නිසා එම ගිවිසුම් අවලංගු කර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කාර්යයන් නියමිත කාලය තුළ සම්පූර්ණ කළ යුතුවේ. |

(ඇ) කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) වියදම් ණයහිමි ගිණුමේ දක්වා ඇති රු.2,923,000ක් වටිනා ව්‍යාපෘති 05ක් ගිවිසුම් කාලය අවසන්වූ පසුවත් කාර්යයන් අවසන් කර නොතිබුණි. | නියමිත ක්‍රියාපටිපාටි සහ රෙගුලාසි අනුගමනය කිරීමෙන් අවසන් ගෙවීම් සිදු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ii) සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වියදම් ණයහිමියන් ලෙස ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.2,040,000ක් වටිනා ව්‍යාපෘති 03ක ගිවිසුම් කාලය අවසන්ව තිබුණත් 2020 මැයි 28 දින වන විටත්, කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | ගිවිසුමේ විධිවිධාන අනුව ඉදිරියේදි නියමිත ක්‍රියාපටිපාටි අනුගමනය කර කාර්යයන් භාර දෙනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති නියමිත කාලය තුළ අවසන් කළ යුතුවේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) සභා බලප්‍රදේශයට අයත් අපද්‍රව්‍ය නිවාස, කඩකාමර, හෝටල්, එළවළු සහ පළතුරු විකුණුම් අලෙවි සැල්, මස් කඩ, කර්මාන්ත ශාලා, රෝහල්, පොදු ස්ථාන ආදියෙන් ලැබෙන අපද්‍රව්‍ය අදාල ස්ථානයට උචිත පරිදි ඝන අපද්‍රව්‍ය වෙන්කිරීමේ ක්‍රමවේදය අනුගමනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය අනුගමනය කිරීමට නියමිතය. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදය අනුගමනය කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාව විසින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව නිලධාරීන්ට පුහුණුවීම් කිසිවක් ලබාදී නොතිබුණු අතර කම්කරුවන් 20දෙනෙකුට වාර්ෂිකව සිදුකළ යුතු වෛද්‍ය පරීක්ෂණයන්ද සිදුකර නොතිබුණි. | ඉදිරියේදී වෛද්‍ය පරීක්ෂණයන් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව පුහුණුවීම් ලබාදිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයන්ද සිදු කළ යුතුවේ. |
| (iii) | දෛනිකව රැස් කරන අපද්‍රව්‍ය පස් තට්ටුවකින් නොවැසීම නිසා මැසිමදුරුවන් බෝවීම පහසුවෙන් සිදුවිය හැකි අතර පරිසරය දූර්ගන්දයෙන් පිරී ඇත. | ජලය රැඳී පවතින මඩ සහිතභූමියක් හෙයින් පස් ඇතිරීමට නොහැකිව ඇත. | පරිසරයට හානියක් නොවන අයුරින් ක්‍රියා කළ යුතුවේ. |

**(ඉ) පාරිසරික ගැටළු**

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අපද්‍රව්‍ය වෙන් කළ හැකි වෙන වෙනම පොදි කිරිමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකර රැස්කරන අපද්‍රව්‍ය ගිනි තැබීම හේතුවෙන් පරිසරය දූෂණයට ලක් වේ. | අපද්‍රව්‍ය වෙන්කර නොදිරන ඒවා විකිණීමටත්, දිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රිකරණයට යෙදවීමටත් කටයුතු යොදා ඇත. | පරිසරයට හානියක් නොවන අයුරින් අපද්‍රව්‍ය ඉවත් කළ යුතුවේ. |
| (ii) | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරා ගෙන තිබූ ප්‍ර දේශයේ මැසිමදුරුවන් බෝවීම වැලැක්වීම සඳහා මැසි තෙල් ඉසීම සහ දූර්ගන්දය වැලැක්වීමට ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | බෙහෙත් තෙල් අවශ්‍යතාවයට අනුව පමණක් ඉසිනු ලැබේ. | පරිසරය ආරක්ෂා කිරීමට පියවර ගත යුතුවේ. |

**(ඊ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ දීර්ඝකාලීන පදනමින් සැලැසුම් සකස් කර නොතිබුණි. | දීර්ඝකාලීන සැලැසුම් කිසිවක් දැනට සකස් කර නොතිබුණි. | දීර්ඝකාලීන සැලැසුම් සකස් කළ යුතුවේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුලධන වැඩසටහන් 12කට ගිවිසුම් ප්‍රකාරව කාලය ප්‍රමාදවීම් දින සඳහා ප්‍රමාද ගාස්තු රු.1,420,409ක් අයකර නොතිබුණි. | කාල ප්‍රමාද දඩ ගාස්තු තැන්පත් කර ඇත. පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් මත කටයුතු කරනු ලැබේ. | ගිවිසුම් ප්‍රකාරව කාල ප්‍රමාද දඩ ගාස්තු අයකළ යුතුවේ. |
| (ආ) | සභාවට අයත් කඩකාමර 152ක මාසික කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු නොකර සභාවේ තීරණ මත මාසික කුලී තීරණය කර අයකරනු ලැබේ. | ඉදිරි කාලයේදී අයකිරීමට කටයුතු කරනු ලැබේ. | තක්සේරු දෙපාර්තමේන්තු තක්සේරු කිරීම් අනුව කුලි අයකළ යුතු වේ. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්**<br>2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 119 ක් හා තථ්‍ය සේවක සංඛ්‍යාව 98 ක් වශයෙනුත් පැවති අතර පුරප්පාඩු 21 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | මෙම පුරප්පාඩුවලින් සේවක පුරප්පාඩු 06 ක් පුරවා ඇත. ඉතිරි සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත. | නියමිත කාලය තුළ පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | **විනය ක්‍රියා මාර්ග**<br>සභාවේ නිලධාරීන් 03දෙනෙකු විනය ක්‍රියාමාර්ග හේතුවෙන් සේවය අත්හිටුවා ඇත. මේ සම්බන්ධයෙන් ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එක් නිලධාරියෙකු මූල්‍ය වංචාවක් හේතුවෙන් විමර්ශනය අවසන් වීමෙන් පසුව චෝදනා පත්‍ර නිකුත් කර ඇති අතර අනෙකුත් නිලධාරියාගේ විමර්ශන වාර්තා මෙතෙක් ලැබී නොමැත. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) | **සේවක ණය**<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය ප්‍රකාරව සේවයෙන් අස්වූ, සේවයෙන් ඉවත්කළ | නිලධාරීන්ගෙන් සේවක ණය අයකරමින් පවතී. | නියමිත කාලය තුළ හිඟහිටි ශේෂයන් අයකර ගත යුතුවේ. |

සහ විශ්‍රාම ගිය නිලධාරින් 04දෙනෙකුගෙන් රු.14,250ක උත්සව අත්තිකාරම් සහ නිලධාරීන් 06දෙනෙකුගෙන් ආපදා ණය හිඟහිටි රු.322,369ක් වර්ෂ 1 සිට 9ක් දක්වා අයකිරීම සඳහා එලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ ධාවන තත්ත්වයේ පවතින වාහන 40ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | සභාව සතුනොවන සහ සභාවට පරිත්‍යාග කරන ලැබූ වාහනවලට වටිනාකම් තක්සේරු කිරීම දුෂ්කර කාර්යයකි. | වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

**3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ වාහන 18ක ආදායම් බලපත්‍ර කල් ඉකුත්වී තිබූ අතර වාහන 12ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. එසේම වාහන 13ක රක්ෂණාවරණය කල් ඉකුත්වී පැවැති අතර වාහන 06කට රක්ෂණාවරණය ලබාගෙන නොතිබුණි. | වාහන 14කට රක්ෂණාවරණය ලබාගෙන ඇත. අනෙකුත් වාහන අයිතිය පරා ගෙන නොමැති නිසා රක්ෂණාවරණය ලබාගැනීම අපහසු වී ඇත. | වාහන ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය ආදිය ලබාගත යුතුවේ. |

**3.4.3 නඩත්තුව හා අලුත්වැඩියා කිරීමට අපොහොසත් වීම**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ වාහන 07 ක් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. මේවා භාවිතා කළ හැකි පරිදි අලුත්වැඩියා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | අත්‍යාවශ්‍ය සේවා වාහන හැර අනෙකුත් වාහන සඳහා අලුත්වැඩියා වියදම් කරනු නොලැබේ. | වාහන ධාවන තත්ත්වයට පත්කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 3.4.4 නිෂ්කාර්ය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ උද්‍යාන දෙකක් සහ කාබනික පොහොර ගොඩනැගිලිවල වටිනාකම රු.11,238,788ක් වර්ෂ දෙකකට අධික කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | භාවිතා කිරීමට කටයුතු කරමින් පවති. | මහජන උපයෝජනය සඳහා යෙදවීමෙන් ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව එල්ලෙන පාලම් ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවා නොතිබුණු අතර ගිවිසුම්ද අත්සන් නොකර රු.1,400,000ක් වටිනා එල්ලෙන පාලම් ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. | එල්ලෙන පාලම් ඉදිකිරීම්වලට සම්බන්ධිත විශේෂඥයින් කිලිනොච්චිය ප්‍රදේශය තුළම සිටි බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියක අවශ්‍යතාවයක් පැන නොනැගිණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ක්‍රියා කළ යුතුවේ. |